

# සඳකඩපහණ

සංස්කාරක - බන්දුල ගුණරත්න

## පිය සටහන්

### වෙනම ගියත් සටන එකටය

විවිධ අරමුණු සහිත අය අප අතර හිටිය. ඒත් එදා අපි එකතුවුණේ එකම වැඩකට. අපි යාපනයට ගියේ 'උදයන්' පත්තරයේ කුගනාදන් සහෝදරයාට ආණ්ඩුවේ මැරයන් කළ පහරදීමට විරෝධය පාන්න. කොළඹින් ගිය ජනමාධ්‍යවේදීන්ට අමතරව ප්‍රවීණ සාහිත්‍යවේදී ගාමිණී වියන්ගොඩ මහත්මයත් අපිත් එක්ක හිටිය.

තමන්ගෙ මාධ්‍ය සගය කුගනාදන් වෙනුවෙන් කොළඹින් ආව කට්ටියව 'උදයන්' පත්තරයේ මාධ්‍ය සගයන් පිළිගත්තෙ බොහොම ලෙන්ගතුව. සහෝදරත්වයට භාෂාව නොතෙත්ම බාධාවක් වුණේ නෑ. අවශ්‍යතාවට අනුව භාෂාව සංවර්ධනය වුණා.

ඉංග්‍රීසි, සිංහල, දෙමළ, හස්ත මුද්‍රා හා වෙනත් අභිනයන්ගෙන් සුසැදි අපූර්ව භාෂාවක් එතන ඉපැදුණා. රාත්‍රියේ නවාතැන්පල වුණේ 'උදයන් ගෙස්ට්' එක. රාත්‍රිය ගෙවාවුණෙ අල්ලාප-සල්ලාප, වාද-විවාද මැද්දෙ.

පසුදින දහවල් කුගනාදන්ට පහරදීමට එරෙහි මාධ්‍ය විරෝධය යාපනය නගර මධ්‍යයේ පුපුරා ගියා. යුද්ධෙන් පස්සෙ ආණ්ඩුවට එරෙහිව එහෙම පිරිසකගේ සහභාගීත්වයෙන් යාපනයේ නගර මධ්‍යයේ පුපුරා ගිය දෙවැනි විරෝධය වුණේ මෙම උද්ඝෝෂණයයි. ඒ අතුරුදන් වූවන්ගේ නම් හෙළිකරන ලෙස ආණ්ඩුවට බලකරල. අරගලයක දී පළමු පියවර තමයි අමාරු. මේ දෙවැනි පියවර. ඒ පළමු පියවර මතකයට ආවේ මේ වගේ දෙවැනි පියවරයන්ට ඊටපෙර පළවෙනි පියවරයන් වැදගත් වුණු නිසයි. ඒ පළවෙනි පියවර තිබ්බෙ ජේ.වී.පී. එක.

ඒව විවේචනය කරපු අත් ඒව විවේචනය කරන ගොඩක් දෙනෙක් මේ දෙවැනි පියවරේ හිටිය. කුගනාදන් සහෝදරයාට පහරදීපු එක ගැන සිංහලෙන් මෙන්ම දෙමළෙන් ද සටන් පාඨ හඬ නැගුණා. ඒ අතර හිටිය ඉතාමත් උද්‍යෝගයෙන් දෙමළෙන් සටන් පාඨ කියූ යුවතියන් පිරිසක්. ඉන් එක් යුවතියක් මං දිහා බලල හිනා වුණා. උද්ඝෝෂණය අවසන් වෙලා ඇය මං ළඟට ආව.

"මට අයියව හොඳට දැකල පුරුදුයි"

ඇය කැඩුණු සිංහලෙන් හා පැහැදිලි ඉංග්‍රීසියෙන් කිව්වා. මගේ මතකය නිවැරදියි. ඇය හා ඇගේ යෙහෙළියන් මට හමුවුණේ යාපනයේ එම්.ආර්.ටී.සී. එකේදි. මාධ්‍ය සම්පත් හා පුහුණු ආයතනයේදී. ඒ මලිතුන් එක්ක Mo-Films අරගෙන යාපනයේ ගිය දවසේ. ඇය යාපනයේ සරසවියෙ ජනසන්නිවේදනය හදාරන සිසුවියක්. ඒත් එදා ඇය ඇතුළු පිරිස අපි දිහා බැලුවෙ ටිකක් දුරින් ඉඳන් ආගන්තුක ලෙස. මිනිසුන් සතුරන් හා මිතුරන් හඳුනාගන්නේ අයිතීන් වෙනුවෙන් කරන අරගල තුළය. එම්.ආර්.ටී.සී. සිසුවියන්ට ද ඒ සත්‍යය පොදුය. මේ උද්ඝෝෂණයට ඔවුන්ගේ පැමිණීම අන් සියල්ලටම වඩා වටිනා බව මට සිතෙයි.

ඔවුන් මේ අඩවියට පය තබන්නේම එය අභියෝගයක් බව දැනගෙන ඊට මුහුණදීමට සූදානමින් නිසාය.

සහෝදරියනේ මේ ප්‍රණාමය තුඹලාටය. ඒ හෙටට වුවමනා, අභියෝගවලදී සැලෙන්නෙ නැති 'මීඩියාකාරයන්' නිසාය.

ඔව්! අභියෝග දිනිය හැක්කේ එක්ව සටන් කිරීමෙනි.

### මං ගොළු වුණා

උඹේ කොළමට හොඳ එකක් මං ළඟ තියෙනවා. නොවැරදීම ඒක බලන් මගේ මිතුරෙක් 2010 ඩයරියක ජූලි 10 ලියපු දින සටහනක කොළයක් මගේ අතේ ගුලි කළා. ඒක තරමක් පොඩිවෙලයි තිබුණෙ. මගේ මිතුරට ඒක දීල තිබුණෙ දැන් ඔහු ඉන්න බෝඩිම් කාමරය අයිති ගෙදර මනුස්සය. එයාට ඒක හම්බවෙලා තියෙන්නෙ කලින් ඒ කාමරයෙ නැවතිලා හිටපු තරුණයකුගෙ ඩයරියක තිබිල. මේ මගේ මිත්‍රය මට දුන්නු පරණ ඩයරි කොළේ ලියැවිලා තිබුණ දේවල්

"අම්ම කතා කළා. පුතේ අනේ වරද්දන් නැතුව තාත්තගෙ බෙහෙත් ටික අරන් එන්න" නංගි කතා කළා. "පොඩි අයිය ඉස්සර වගේ දැන් අපි ගැන බලන්නෙ නෑ." මල්ලි කතා කළා. අයියෙ කෝස් එකට තව රුපියල් 3,500/-ක් බඳින්න ඕන. කෙල්ල කතා කළා. "මේ පාර අපේ බැප් ට්‍රිප් එක යන්න ඔයත් එනවා නේද? ඒ කාටවත් දෙන්න පුළුවන් උත්තරයක් මං ළඟ තිබුණෙ නෑ. මං ගොළු වුණා.

### පගෝඩා - වෙන්ඩාම්

අපි 'උදයන්' කාර්යාලයෙන් පිටවෙලා කොළඹ එන්න බස් එකට ගොඩවෙන්න යද්දි, චන්දන මල්ලි ගියා බුලත් විටක් ගන්න කියල. ඒත් එක්කම යාලිකත් ගිය නිසා මාත් ඒ පැත්තට ගියා. මං යනකොට චන්දන කඩේක මල්ලි කෙනෙක් එක්ක ගජරාමෙට කතාව.

බුලත් විට ගත් චන්දන බස් එකේදි හපන්න යාපනේට ආවේණික කෑමක් හොයනව. කඩේ මල්ලි කලින් මීගමුවෙ ඉඳපු කෙනෙක්. එයාට හොඳට සිංහල කතා කරන්න පුළුවන්.

චන්දන කඩේ තිබුණ කලින් දැක නැති 'පගෝඩා' ඉල්ලුව. 'පගෝඩා වෙන්ඩාම්' කඩේ මල්ලි දෙමළෙන් කියාපු එක චන්දනට තේරුණෙ නෑ. පස්සෙ ඔහු ඒක අපිට තේරෙන සිංහලෙන් කිව්වා.

"ඒවා කෑවම මත්වෙනවා. ඒව ඔයාල ගන්න එපා. ඒක හොඳ නෑ."

අපි හුගාක් වෙලාවට දකින්නෙ ඕනෑම ජරාවක් විකුණල තමන්ගෙ මඩිය තරකරගන්න හාදයො.

ඒත් මේ 'දෙමළ' මල්ලිට 'සිංහල' අපිව මත් කරන්න ඕන වුණේ නෑ. භාෂාවන් අතර වෙනස්කම් තිබුණට සහෝදරකම් අතර වෙනස්කම් නෑ.

මල්ලි උඹ නොකියා කිව්වෙ ඒකද?

■ ප්‍රියන්ත ලියනගේ

---

# 'අවුල්' on the stage

බකමූණා විදි බැස මේ වන විට දෙසතියකුත් ඉක්ම ගොසිනි. අගෝස්තුව ආරම්භ වීමට ප්‍රථම බකමූණා විදි බසින බවට දැවැන්ත ප්‍රචාරක ව්‍යාපාරයක් ආරම්භ වී තිබිණි. අන්තර්ජාලය, පුවත්පත් පමණක් නොව විද්‍යුත් මාධ්‍ය හරහා ද මේ ප්‍රචාරක ව්‍යාපාරය දියත්වනු දක්නට ලැබිණි. මේ ප්‍රචාරක ව්‍යාපාරය තුළ බකමූණා විදි බසී යන්න ඉංග්‍රීසියට වර නගා තිබුණේ owl on the stage ලෙසිනි.

රාජිත දිසානායකගේ නාට්‍යයක් කරළියට පැමිණීමේ පුවත අප තුළ ද සුබවාදී බලාපොරොත්තුවක් ජනිත කළේ ය. ඒ ඔහු විසින් මේ වන විට වේදිකාවට තිළිණ කර තිබෙන නාට්‍ය අප සමඟ යම් සවිඥානික රසවින්දනාත්මක ගනුදෙනුවකුත් දේශපාලන ගනුදෙනුවකුත් තියැබුණු නිසාය. මංගල දර්ශනය දවසේ ම owl on the stage බලන්නට අපව උත්තේජනය කළේ ඊ කාරණාවය. ඒ අනුව පිරී ඉතිරී ගිය ප්‍රේක්ෂකාගාරයක හිඳ අපි owl on the stage නැරඹුවෙමු. එහෙත් පූර්ව ප්‍රචාරක ව්‍යාපාරය තුළ අපි දුටු owl on the stage වෙනුවට වේදිකාව මත දිගහැරුණේ අවුල් on the stage නමැති නාට්‍යයකි.

රාජිතගේ owl අවුල් ලෙස වේදිකාවට සම්ප්‍රාප්තවීම නිසා ඇතිවූ කම්පනය මේ සටහන තැබීමට අපව පොළඹවන්නට විය. එහෙයින් පළමු කොට owl on the stage තුළ ඇස ගැටුණු අවුල ගැන කියන්නෙමු.

හංසයින්ටත් මං ආසයි, වීරයා මැරිලා, මට වෙඩිතියන් නැද්ද, සිහින හොරු අරන්, ආපසු හැරෙන්න බෑ නාට්‍ය තුළින් අප හඳුනාගත් රාජිත යනු ලාංකීය වේදිකාව මතට වෙනත් ආරක නාට්‍ය ප්‍රවේශයක් හඳුන්වා දුන් නාට්‍යකරුවෙකි. මුල්කාලීනව ඔහුගේ නාට්‍ය නාට්‍ය ලෙස හඳුන්වන්නට පවා බොහෝදෙනා අකැමැති වූයේ මේ වෙනස නිසා ය. නාට්‍යවේදයේ නාට්‍යයක් වෙනුවෙන් ඉල්ලා සිටින අත්‍යවශ්‍ය ගුණාංගයන් ඔහු සිය නාට්‍ය ධර්මය තුළ අත්හළ නාට්‍යකරුවෙකි. ඔහුගේ නාට්‍ය තුළ පෙළෙන් පෙළට දිවෙන මහා ගැටුම් නැත. ඒ ගැටුම් තුළින් ජනිත වන මහා කුතුහලයක් නැත. නාට්‍යෝචිත අවස්ථා කියා සැලකිය හැකි අමුතු දේවල් නැත. මේ නිසාම රාජිතගේ නාට්‍ය වෙනත් ආරක් ගත්තේ ය. 'හංසයින්ටත් මං ආසයි' සිට 'ආපසු හැරෙන්න බෑ' දක්වා මේ නව ආර අඩු - වැඩි වශයෙන් නඩත්තු කළ රාජිත සිය නිර්මාණ හරහා ලාංකීය වේදිකාව තුළ යම් ලකුණක් ද තැබුවේ ය.

නාට්‍යවේදය තුළ ඉල්ලා සිටින මූලික ගුණාංගයන් රාජිතගේ නිර්මාණ තුළ නොමැති වූවාට ඒවා දියුණු නාට්‍යයන් ලෙස (සියල්ල නොවේ) කවහැර හැඳින්වීමට අපි සූහක නොවන්නෙමු. ඔහුගේ නාට්‍ය නඩත්තු වූයේ දෙබස් හා රංගය මතය. සමකාලීන සමාජ දේශපාලන විවේචනය රාජිතගේ නාට්‍ය තුළ විවිධාකාරයෙන් නාට්‍ය පෙළ බවට පත්වේ. මේ නාට්‍ය පෙළ ද මෙතුවක් යම් සාධනීය ගනුදෙනුවක් කළ බව මගේ විශ්වාසයයි.

බකමූණා රඟෙන රාජිත කරළියට පැමිණෙන්නේ යුද්ධයෙන් හරියටම අවුරුදු දෙකකට පසුවයි. යුද්ධයෙන් පසු බොහෝ පුරුෂාර්ථයන් අවුල්ව අන්දමන්දව ගියා සේම රාජිතගේ නාට්‍ය ධර්මය ද අවුල්ව අන්දමන්දව ගොස් ඇති අයුරු බකමූණා තුළින් දුටුවෙමි.

මෙය අතිශය සරල සුගම පෙළකි. මතුපිට විවිධ අන්වර්ථ නාම හරහා කතා කෙරෙන්නේ පවතින දේශපාලනය ය. යටි පෙළ ද එයමය. කොටි, පොළඟුන් වී ඇත. කුවක්කු, පොලු වී ඇත. සමකාලීන විදූෂක දේශපාලන චරිත යැයි සැක සිතිය හැකි භූමිකා විවිධ නම්වලින් වරින් වර පෙනී සිටී. පළමු රංගයේ සිටම රාජිත මෙය හාස්‍යෝත්පාදක නාට්‍යයක් ලෙස ගෙන එන්නට උත්සාහ දරා තිබේ. පළමු රංගයේ සිටම රාජිතගේ උත්සාහය සාර්ථක කරමින් ප්‍රේක්ෂකාගාරය හිනාවෙන්නට පටන් ගනී.

එහෙත් නාට්‍යය අවසන් වූ පසු ඒ හිනාවට සමුදීම විනා ඔවුන්ට නාට්‍යය සමග වෙනත් දියුණු ගනුදෙනුවක් කිරීමට තරම් අවකාශයක් රාජිත ඉතිරි නොකරයි. සත්‍ය ලෙසම ප්‍රේක්ෂකාගාරය සිනාසෙන්නේ තමන් තුන්සිය හැටපස් දවසේම දකිමින් සිටින දේශපාලන විහිළුකරුවන්ගේ රංගයට ය. එයට හොඳම උදාහරණය ජැක්සන් ඇන්තනි ය. ජැක්සන් විදූෂකයෙක්, බම්බන්නෙක් බහුභූතයෙක් බවට පත් වූයේ දනට වසර කිහිපයකට උඩ දී ය. දැන් ජැක්සන්ව දකින වාරයක් වාරයක් පාසා ජනතාව ඔහුගෙන් බලාපොරොත්තු වන්නේ බරසාර සිංහලෙන් දේශනා කරන ඉල ඇදෙන විහිළු ය. තමන්ගේ මාර්කට් එක හොඳින් දන්නා ජැක්සන් ඒ අනුවම යමින් බරසාර සිංහලෙන් ඉල ඇදෙන විහිළු සපයයි. රාජිත මේ කියන්නාවූ ජැක්සන්ව වෙනත් නමකින් වෙනත් වේශයකින් වේදිකාවට රඟෙන ඒ. ඔහුගේ විහිළු දකින ප්‍රේක්ෂකයා මේ ජැක්සන් නේද කියා අනුමාන කර මනසින් ඔහුගේ බරසාර ඉල ඇදෙන විහිළු මවාගෙන සිනාසෙන්නට පටන් ගනී. අනෙක් චරිත ද එසේ ය.

නාට්‍ය පෙළ තුළ ම රාජිත අවුලට පත්වන්නේ මේ නිසා ය. ඔහුට අවශ්‍ය වී තිබෙන්නේ සුලබ දේශපාලන හාස්‍යය එපරිද්දෙන්ම ප්‍රතිනිර්මාණය කිරීමට ය. එහි ගැඹුරකට යාමට, වෙනත් මානයකින් දැකීමට රාජිත උත්සාහ නොකරයි. උදේ හවස දකින, උදේ හවස කතා කරන, අපි උදේ හවස ලියන දේශපාලන සිදුවීම් වෙනත් ලේබලින් නාට්‍ය තුළ ඇමිණී තිබෙන්නේ මේ නිසා ය.

බකමූණා පෙළ දියුණු නාට්‍ය පෙළක් ලෙස කිසිසේත්ම හැඳින්විය නොහැක. එය නාට්‍යයකට වඩා ළංවන්නේ ප්‍රාථමික වීදි නාට්‍යකට ය. විශ්වවිද්‍යාල වීදි නාට්‍ය කණ්ඩායම් මේ ගණයේ බොහෝ වීදි නාට්‍ය නිර්මාණ ඉදිරිපත් කරනු ඕනෑතරම් දැක තිබේ. රාජිත ද දැනුවත්ව හෝ නොදැනුවත්ව ළං වී තිබෙන්නේ ඒ අසලට ය.

බකමූණා පෙළ තුළ ඇති ඊළඟ ගැටලුව වන්නේ නාට්‍යයේ අවසානයයි.

කිසිසේත්ම බලාපොරොත්තු නොවන තැනක කිසිලෙසකින්වත් බලාපොරොත්තු නොවිය හැකි ආකාරයෙන් රාජිත සිය නාට්‍යය අවසන් කර දමයි.

නාට්‍යකරුවෙක් සිය නිර්මාණය අවසන් කළ යුත්තේ ප්‍රේක්ෂකයා බලාපොරොත්තුවන තැනකින් කියා මම නොකියමි. එය ප්‍රේක්ෂකයා බලාපොරොත්තු වන ආකාරයෙන් ද නොවුණාට කම් නැත.

එහෙත් නාට්‍යකරුවෙක් තම නාට්‍ය අවසන් කළ යුත්තේ මෙතෙක් නාට්‍ය රඟෙන ආ මාවතෙන් ප්‍රේක්ෂකයා මංමුළා කර දමන තැනකින් නොවන බව මගේ විශ්වාසයයි. රාජිත ප්‍රේක්ෂකයා මංමුළා කර දමන තැනකින් නාට්‍යය අවසන් කර දමයි. නොදියුණු පෙළක් සමග වුව ගමන් කරන ප්‍රේක්ෂකයාට ඉන් අත්වන්නේ බරපතළ අසාධාරණයකි.

නාට්‍යය අවසන් කරමින් රාජිත ලබාදෙන ඉඟිය ගැටලු ගොඩක මූලාරම්භයකි.

"බකමූණගෙ ගමන අතරමග නතරවෙයි කියලද හිතන්නේ"

නාට්‍යයේ අවසන් දෙබසින් රාජිත කියන්නට හදන්නේ මේ ක්‍රමය කිසිදා නොවෙනස් වන බව ද....? නාට්‍ය පුරා යථාව දකින මාධව නම් තරුණයා අරගලකාරී මාවතින් මිදී නැවත වේදිකාවට අවතීර්ණ වීමෙන් රාජිත ඉඟිකරන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ගමනකින් සියල්ල කෙළවර වියයුතු බවද...? නැතිනම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ගමනකින් සියල්ල කෙළවර වෙන බවද...? නාට්‍යකරුවා මේ ඉදිරිපත් කරන්නේ සිදුවන දේද...? සිදුවිය යුතු දේද....? සිදුවිය හැකි දේද...? නාට්‍ය අවසානයේ මෙපමණ උභතෝකෝටිකයක් නිර්මාණය කරගැනීමෙන් රාජිත ඇගබේරාගත්තේද...?

මේ සියලු පැනයන් ඔස්සේ මට පෙනෙන නිගමනය වූයේ රාජිත දෙබරය පෙනි පෙනී දෙබරයට ගල නොගසා වටේ ගල් ගැසූ බවයි. owl on the stage තුළ මා දුටු ඊළඟ අවුල වූයේ නාට්‍ය පෙළ වේදිකාව මත ස්ථාපිත කිරීමේ දී හටගත් අවුලයි. බකමූණා සඳහා රාජිත තෝරාගත්තා නළුනිළි කැල අතිශය දක්ෂ රංග ශිල්පී ශිල්පිනියන් බව අවිවාදිතයි. වේදිකාව තුළ තමන් ලබා ඇති පරිචය නිසාත් රංග ශිල්පීන්ගේ ශිල්පීය හැකියාව නිසාත් රාජිත තමන් ලියූ දුර්වල පෙළ වීදි නාට්‍යයකින් මුදවාගෙන වේදිකා නාට්‍යයක් බවට පරිවර්තනය කරගැනීමට සමත් වේ. එහෙත් ඒ වේදිකා නාට්‍යයක් ලෙස පරිවර්තනය වූ නාට්‍ය තුළ ද ඇති වියවුල ඛේදනීයය.

සිය නාට්‍යාවලිය තුළ මෙතෙක් රාජිත අඩුවෙන් භාවිත කළ ෆිසිකල් තියටර් උපක්‍රම බකමූණා සඳහා රාජිත භාවිත කරන්නට උත්සාහ දරයි. පොලු හමුදාවෝ පොලු රඟෙන පොලු සටන් නටති. ප්‍රචණ්ඩකාරීත්වය උද්දාමයට පෙරළීම හරහා පවතින යථාර්ථයක් සිහියට ගෙන ඒමට රාජිත සමත්ව ඇතත් එය රංග කාර්යයක් ලෙස ඉතා බාල බව කිව යුතු ය.

රංග වින්‍යාසය ගොඩනැගීමේ දී පරිණත නළුවෝ ආධුනික රංග කාර්යයන්වල නියැළෙන්නන් බවට පත්වී තිබේ. නැතිනම් පත්කර තිබේ. නාට්‍ය පුරා ඇත්තේ රංගවේද අච්චාරුවකි. ප්‍රියංකර රත්නායක අධිරංගයක නියැළේ. ධර්මප්‍රිය ඩයස් ද එයට නොදෙවෙනි තැනක හිඳ රංගයට අවතීර්ණ වේ. ප්‍රසාද් සූරියාරච්චි ද ඒ මගම යන්නට යත්න දරයි. ශාම් සමග සමිත ස්වභාවික රංගයේ පිහිටයි. ජයනි ජයනි ලෙසින්ම වේදිකාව මත සිටගෙන සිටී. [illegible] හැසිරේ. මේ රංගවේද අච්චාරුවෙන් රාජිත උත්සාහ දරා තිබෙන්නේ බලහත්කාරී හාස්‍යයක් මතුකිරීමට ය. ඒ අරමුණ අනුව රාජිත සාර්ථක ය. ප්‍රේක්ෂකාගාරය බඩ අල්ලන් හිනා වූයේ ඒ නිසා ය.

මේ දක්ෂ නළු - නිළි කැල මීට වඩා සූක්ෂමව හැසිරවූවා නම් (පෙර නාට්‍යවල මෙන්) බකමූණා අසාර්ථක පෙළක් වුවත් සාර්ථක නිෂ්පාදනයක් බවට පත්වන්නට ඉඩ තිබිණි.

සිය පරිණත නාට්‍ය ධර්මයෙන් බැහැරව රාජිත වෙනත් ආකෘතියක පිහිට පතන්නට ගියේ බලහත්කාරයෙන් තිරිහන්වීමටද...? අද වන විට තරුණ නාට්‍යවේදීන් වේදිකාව මත පාන සුලබ ආකෘතික හරඹයේ රාජිත ද ගොදුරක් වී ඇති බව මගේ පෞද්ගලික විශ්වාසයයි. මේ බලහත්කාරී තිරිහන්වීමේ ප්‍රතිඵලයක් ලෙස රංගවේදය අච්චාරුවක් වී තිබේ. රංග වින්‍යාසය බාල වී තිබේ.

සමස්ත නාට්‍යය පුරාවටම මා දුටු සාධනීය ලක්ෂණයක් ගැන ද සටහනක් තැබිය යුතු ය. බකමූණා තුළින් ශාම් නමැති විශිෂ්ට නළුවා යළිත් වතාවක් ඔසවා තබන්නට රාජිත සමත්වී තිබේ. ශාම් සිය චරිතයට මහා සාධාරණයක් ඉටු කරයි. ඔහුගේ රංගය සෙසු නළුවන් අබිබවා යන්නේ වේදිකාව මත ඉතා සීරුමාරුවට සිය රංගය හසුරුවන නිසා ය. වේදිකාව තුළ ශාම් අතිශය සැහැල්ලුය.

එහෙත් ඒ සැහැල්ලු බව රඳවා ගනිමින් සිය අභිනයන් ඉතා සීරුමාරුවට හසුරුවන්නට ශාම් සැලකිලිමත් වේ. සෙසු නළුවන් ඔහේ අත පය විහිදුවමින් දඟලද් දී ශාම් බැල්මකින්, සියුම් අභිනයකින් කියන්නට අවැසි සියල්ල කියා සිටී. ඔහුගේ අත පය දෙබසින් දෙබසට ඉහළ පහළ නොයයි. අත පය එසවෙන්නේ ඉඳ හිටය. එසේ ඉඳහිට එසවෙන තැන් අතිශය ප්‍රබල ය. ශාම්ගේ රංගනය සේම මාධවගේ චරිතය නිරූපණය කළ සමිත ද සිය චරිතය සඳහා මහා සාධාරණයක් ඉෂ්ට කර තිබේ.

owl on the stage ගැන ලියූ මේ සටහන අවසන රාජිතට යමක් කිව යුතුය. 'හංසයින්ටත් මං ආසයි' සිට 'ආපසු හැරෙන්න බෑ' දක්වා ඔබ පැමිණි මග අතිශය නිරවුල් ය.

එය ලාංකීය ප්‍රේක්ෂකයාට නව මානයක සිට නාට්‍ය විඳින්නට නාට්‍ය රුචිය දල්වූවකි. එසේ නාට්‍ය කළ ඔබට owl තුළ වන අවුල නොවැටහීම ඛේදයකි. මේ සටහන තැබුවේ ඔබව අවුල් කිරීමට නොව ඔබ අවුලව යෑම වැළැක්වීමටය.

■ අසංක සායක්කාර

Scan with EasyScan